# පිළිකුත්තුව රජමහා විහාරය ආශ්‍රිත උරුම කළමනාකරණය පිළිබඳ විමර්ශනයක්

ඊ.කේ.සී. පබසරා[1]

යම් පුරාවිද්‍යාත්මක හෝ ස්වාභාවික උරුම ස්ථානයක පවතින අගයන් ආරක්ෂා කර ගනිමින් අනාගතය දක්වා පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය උරුම කළමනාකරණයයි. එකී ක්‍රියාවලිය තුළ වර්තමානයේදී වැඩි අවධානයක් යොමු විය යුතු ස්ථානයක් ලෙසින් ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි පිළිකුත්තුව රජමහා විහාර ක්ෂේත්‍රය හඳුනාගත හැකිය. මින් පෙර අවස්ථා කිහිපයකදී විවිධ පර්යේෂකයන් විසින් මෙම ක්ෂේත්‍රයේ පවතින ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අගයන් පිළිබඳව පර්යේෂණ සිදුකර, වාර්තා කර ඇති නමුත් නිසි අවධානයක් යොමු නොවීම හේතුවෙන් මෙම උරුමස්ථානයේ පැවැත්ම අද වනවිට දැඩි අවධානමකට ලක්වී තිබේ. එබැවින් පිළිකුත්තුව රජමහා විහාරය ආශ්‍රිත අගයන් හඳුනාගෙන ඒවා නිසි කළමනාකරණයකට ලක්කිරීම සඳහා වන අවැසිතාවය පදනම් කරගනිමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත. ක්ෂේත්‍ර ගවේෂණය, සාහිත්‍ය මූලාශ්‍රය පරිහරණය මෙන්ම සම්මුඛ සාකච්ඡා සහ අන්තර්ජාලය භාවිතය ඔස්සේ දත්ත ග්‍රහණය කරගන්නා ලදී. ලබාගත් දත්ත පදනම් කරගනිමින් පර්යේෂණයට අදාළ උරුම කළමනාකරණ සැලැස්ම පියවර කිහිපයක් යටතේ සැලසුම් කරන ලදී. ක්ෂේත්‍රයේ අගයන් හඳුනාගැනීම ඉන් පළමු වැනි පියවර විය. දෙ වැනි පියවර යටතේ එම අගයන් ආරක්ෂා කිරීමට අදාළ පිරිසිඳු ක්‍රමානුකූල ක්‍රියාවලියක් සැකසූ අතර තුන් වැනි පියවර ඔස්සේ එම සැලසම් ක්‍රියාවට නැංවීමට අදාළ උපක්‍රම සැකසීම හා ක්‍රියාත්මක කිරීම සිදුවෙයි. හතර වැනි පියවර යටතේ ක්‍රියාවලියට සමගාමීව පසුවිපරම් හා ඇගයීම් සිදුකර පිළිකුත්තුව රජමහා විහාර භූමිය ඉතා ආරක්ෂාකාරීව අනාගතය කරා රැගෙන යාම මින් අපේක්ෂා කෙරේ. මෙම කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ප්‍රධානවම ප්‍රදේශයේ පවතින භෞතික හා මානව සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට බලාපොරොත්තුවේ. ලබාගත් දත්තයන්ගෙන් හඳුනාගත හැකි වූ පරිදි, තෙත් කළාපීය වනාන්තරයක් වශයෙන් අධි නාගරික පරිසර පද්ධතියක පිහිටා ඇති මෙම ක්ෂේත්‍රය මත පවතින පාරිසරික සම්පත්වල අගය ඉහළ දැමීම සඳහා ද, පවතින තත්ත්වයට වඩා පහසුකම් සැලසීමට ද මෙහි දී අවධානය යොමු කර ඇත. මේ ආකාරයෙන් පිළිකුත්තුව විහාර භූමිය ආශ්‍රිත උරුම කළමනාකරණ සැලැසමක් සකස් කිරීම හරහා එහි පවතින අගයන් නියමාකාරයෙන් ආරක්ෂා කරමින් අනාගතය කරා පවත්වාගෙන යාමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : පිළිකුත්තුව, උරුම කළමනාකරණය, කේෂ්ත්‍රය, අනාගතය, දත්ත, පියවර

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.ekcp1997@gmail.com